**ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - 2017**

**-----------------------------------------------**

ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ 2017 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් මාස 09 ක කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (කෘසංජාඅ) අතර 2012 ජනවාරි 30 දින එළඹි අංක අයි-857-එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ IX ව්‍යවස්ථාවේ, 9.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-----------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර උතුරු පළාතේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ ජලයේ හා භූමියේ ඵලදායිතාව පිළිබඳ තිරසාර සංවර්ධනයක් ලඟාකර ගැනීමට හැකිවන පරිදි වාරි යටිතල පහසුකම් ඵලදායීව හා තිරසාරව කළමනාකරණය කිරීම වැඩි දියුණු කිරීමයි. මූල්‍ය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 3,782.43 කට සමාන එජඩො මිලියන 29.32 ක් වන අතර, ඉන් රු.මිලියන 2,819.77 කට සමාන එජඩො මිලියන 22.23 ක් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ඊට අමතරව, රු.මිලියන 160 කට සමාන එජඩො මිලියන 1.23 ක් හා රු.මිලියන 351 කට සමාන එජඩො මිලියන 2.70 ක් පිළිවෙලින් පුද්ගලික අංශයේ ආයතන හා ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් විසින් දායකවීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජනවාරි 30 දින ආරම්භ කරන ලද අතර, 2017 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, 2017 සැප්තැම්බර් 30 දක්වා මාස 09 ක කාල පරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**-------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට හා ව්‍යාපෘති විගණනය සඳහා වූ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ මාර්ගෝපදේශවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා

ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 සැප්තැම්බර් 30 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඒ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් මාස 09 ක කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2017 සැප්තැම්බර් 30 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ මාර්ගෝපදේශවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමින් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා

සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2017 සැප්තැම්බර් 30 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාව මගින් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

---------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

---------------------------

මූල්‍යයනය, සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ හා 2017 සැප්තැම්බර් 30 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | | උපයෝජනය කළ අරමුදල් - සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ | | උපයෝජනය කළ අරමුදල් - 2017 සැප්තැම්බර් 30 දිනට | |
|---|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| කෘසංජාඅ | 22.23 | 2,819.77 | 5.96 | 892 | 3.70 | 560.44 | 20.46 | 2,883.43 |
| පෞද්ගලික අංශ සංවිධාන | 1.23 | 160.00 | - | - | - | - | 0.01 | 0.58 |
| ප්‍රතිලාභීන්ගේ දායකය | 2.70 | 351.00 | - | - | 0.03 | 3.78 | 0.19 | 25.18 |
| ශ්‍රීලංර | 3.16 | 451.43 | 1.24 | 185 | 1.18 | 117.14 | 3.01 | 366.57 |
| එකතුව | 29.32 | 3,782.20 | 7.20 | 1,077 | 4.91 | 681.36 | 23.67 | 3,275.76 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 සැප්තැම්බර් 30 දිනට ව්‍යාපෘතියේ කටයුතු නිම කර තිබූ අතර, රු.මිලියන 2,819.77 කට සමාන එජඩො මිලියන 22.23 ක මුළු වෙන්කිරීමෙන් රු.මිලියන 2,883.43 කට සමාන එජඩො මිලියන 20.46 ක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයේදී උපයෝජනය කර තිබුණි.

(ආ) රු.මිලියන 160 කට සමාන එජඩො මිලියන 1.23 ක් හා රු.මිලියන 351 කට සමාන එජඩො මිලියන 2.70 ක් වූ පිළිවෙලින් පුද්ගලික අංශයේ සංවිධානයන්ගෙන් හා ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ගෙන් අපේක්ෂිත දායකයෙන් රු.මිලියන 0.58 කට සමාන එජඩො මිලියන 0.01 ක්

හා රු.මිලියන 25.18 කට සමාන එජඩො මිලියන 0.19 ක් වූ දායකය පමණක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයේදී ලැබී තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

---------------------

ව්‍යාපෘති නිම කිරීමේ වාර්තාව අනුව, ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකයන් වූ කෘෂිකාර්මික නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය, ඉරණමඩු ප්‍රදේශයේ ජලය හා ඉඩම්වල තිරසාර වර්ධනයක් සපුරා ගැනීම සඳහා ඒ පිළිබඳ ව්‍යාප්ත කිරීම හා අලෙවි කිරීමේ කටයුතු 2017 සැප්තැම්බර් 30 දිනට සම්පූර්ණ කර තිබුණි. කෙසේ වුවද, යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය නම් වූ වෙනත් ප්‍රදාන මූල්‍යායන ව්‍යාපෘතියක් යටතේ සිදු කළ යුතු වූ ඉරණමඩු ජලාශයේ ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා කාර්යයන් 2017 දෙසැම්බර් 31 වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතිය විසින් නිම කරන ලද යටිතල පහසුකම් සංවර්ධන වැඩ ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රතිලාභ සඳහා සම්පූර්ණයෙන්ම උපයෝජනය කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව, කිලෝමීටර් 30 ක් වූ වාරිමාර්ග පද්ධතියේ සියලුම ප්‍රධාන ඇල මාර්ගවල පුනරුත්ථාපන වැඩ ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසානයේදී නිම කර තිබුණි. කෙසේ වුවද, ශාඛා/ බෙදාහැරීම් ඇල මාර්ග කිලෝමීටර් 135 ක් හා කුඹුරු ඇල මාර්ග කිලෝමීටර් 123 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා අපේක්ෂා කර තිබුණද, අරමුදල් වෙන්කිරීම ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ශාඛා/ බෙදාහැරීම් ඇල මාර්ග කිලෝමීටර් 113 ක් හා කුඹුරු ක්ෂේත්‍ර ඇල මාර්ග කිලෝමීටර් 22 ක් පුනරුත්ථාපනය කිරීමේ වැඩ පමණක් ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසානයේදී සම්පූර්ණ කර තිබුණි. තවද, 2018 පෙබරවාරි 23 දින විගණකවරුන් විසින් සිදුකරන ලද භෞතික නිරීක්ෂණයන්හිදී පරන්තන් ප්‍රදේශයේ ඇල මාර්ග තිරසාර ආකාරයෙන් පවත්වා ගැනීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් පස් සහ වෙනත් එකතු වූ කසල වලින් එම ඇල මාර්ග පිරී තිබුණු බව අනාවරණය විය.

(ආ) ආරම්භක ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, ව්‍යාපෘතියේ යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් සඳහා සංරචකය යටතේ කුඩා පරිමාණ සහල් සකස් කිරීමේ මධ්‍යස්ථාන 427 ක් ඉදිකිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, ගොවි සංවිධානවල ප්‍රයෝජනය සඳහා විශාල පරිමාණ වී ගබඩා පහසුකම් 3 ක් සහ වී වේලීම් ස්ථාන (drying floors) 19 ක් පමණක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයේදී ඉදිකර තිබුණි.

(ඇ) තවද පරන්තන්, රාමනාදන්පුරම් හා පනන්කන්ඩි හි රු.මිලියන 36 ක පිරිවැයකට ඉදිකරන ලද විශාල පරිමාණ වී ගබඩා ප්‍රදේශයේ ගොවින්ගේ භාවිතය සඳහා 2016 අගෝස්තු 23 දින නිල වශයෙන් විවෘත කර තිබුණු අතර 2018 පෙබරවාරි 23 වන විටත් පනන්කන්ඩි ගබඩාවලින් කොටසක් පමණක් උපයෝජනය කර තිබුණි. 2018 පෙබරවාරි 23 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවට අනුව, පරන්තන්හි ඉදිකරන ලද ගබඩා ගොඩනැගිල්ලේ විශාල අඩුලුහුඩුකම් කිහිපයක් අනාවරණය විය. තවද, වී ගබඩා කාර්යයන් සඳහා අදාළ ගොඩනැගිල්ල විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබුණු බවද අනාවරණය විය.

(ඈ) ව්‍යාපෘති ඇගයීම් වාර්තාවට අනුව, ව්‍යාපෘති ප්‍රදේශයේ බොරළු මාර්ග කිලෝමීටර් 150 ක් ව්‍යාපෘතිය විසින් පුනරුත්ථාපනය කිරීම සඳහා සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, බොරළු මාර්ග කිලෝමීටර් 20 ක් පමණක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයේදී පුනරුත්ථාපනය කර තිබූ බව අනාවරණය විය. තවද, වෙනත් ගොවිපොළ මාර්ග කිලෝමීටර් 25 ක් කොන්ක්‍රීට් මාර්ග ලෙස ප්‍රතිසංස්කරණය කර තිබුණි.

(ඉ) නිෂ්පාදන ව්‍යාප්ත කිරීම හා අලෙවි කිරීම සංරචකය යටතේ රු.මිලියන 345.8 කට සමාන එජඩො මිලියන 2.47 ක වෙන්කිරීමක් කර තිබුණු අතර ඉන් රු.මිලියන 275.6 කට සමාන එජඩො මිලියන 1.96 ක් පමණක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයේදී උපයෝජනය කර තිබුණි. රාජ්‍ය නොවන සංවිධාන හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී පැවැත්වීම සඳහා අපේක්ෂා කරන ලද පුහුණු වැඩසටහන් 3,043 කින් වී නොවන වගා කාණ්ඩ සැකැස්ම, වගා විවිධාංගීකරණය ප්‍රදර්ශනය කිරීම සහ ගොවිපොළ ප්‍රදර්ශනයන් ආදිය පිළිබඳ කිසිදු පුහුණු වැඩසටහනක් 2017 සැප්තැම්බර් 30 දිනට පවත්වා නොතිබූ බව අනාවරණය විය.

**3.3 මතභේදයට තුඩුදෙන කරුණු**

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 සැප්තැම්බර් 30 දින ව්‍යාපෘති කාර්යයන් අවසන් කිරීම පිළිබඳ සැලකීමකින් තොරව 2017 පෙබරවාරි 15 දින රු.මිලියන 16 ක පිරිවැයකට මෝටර් වාහන 2 ක් ප්‍රසම්පාදනය කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණු බවත් එම වත්කම් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයට පවරා තිබුණු බවත් නිරීක්ෂණය විය.

(ආ) මුල්‍ය ප්‍රකාශන අනුව, කුමාරපුරම්හි වගාකරන ලද කුඹුරු සංවර්ධනය කිරීම සඳහා සැලැස්මක් පිළියෙල කිරීමට ව්‍යාපෘතිය විසින් රු.මිලියන 4.20 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, අදාළ සැලැස්ම පදනම් වූ ප්‍රදේශයේ කුඹුරු සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් කරන ලද කටයුතු පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම**

------------------------------------

2017 මාර්තු 31 දිනට ව්‍යාපෘති කාර්යයන් අවසන් කර තිබූ අතර, සියලු හිමි විය යුතු වියදම් පිළිබඳ හිමිකම් 2017 සැප්තැම්බර් 30 වන විට ලබාගෙන තිබුණි. තවද, ව්‍යාපෘතිය නිම කිරීමේ වාර්තාවද 2017 සැප්තැම්බර් 20 දින ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද, රු.මිලියන 29 ක් වටිනා වත්කම් අදාළ පාර්ශවයන්ට භාරදීම හා වසා දැමීමේ ගිණුම් පිළියෙල කිරීම පිළිබඳව ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට උපදෙස් නිකුත් කර නොතිබුණි.